**ශීර්ෂය 204 - හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**

**-----------------------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

----------------

**1.1 මතය**

-------

හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවටඅදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 02 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශනවලින් 2019දෙසැම්බර් 31 දිනට හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

**--------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**-----------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරිමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමන් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනයතුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය හා 38 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) මෙම වාර්තාවේ 1.6.1 ඡේදයේ ඇතුළත් නිරීක්ෂණ සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

-----------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දී හා ඉකුත් වර්ෂයේදී වෙනත් ගණන්දීමේ නිළධාරීන් වෙනුවෙන් රැස් කළපිළිවෙලින් රු.11,527,362ක් හා රු.9,562,994ක් භාණ්ඩාගාරයෙන් ලද අක් මුදල් ලෙස සටහන් කිරීම වෙනුවට බදු නොවන ආදායම් හා වෙනත් ලැබීම් ලෙස සටහන් කර තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 7(ii) ඡේදය හා 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 7(ii) ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | වැරදීමකින් ACA 1 යටතේ සඳහන් කර ඇත. මින් ඉදිරියේදී භාණ්ඩාගාරයෙන් ලද අක් මුදල් ලෙස සලකා සටහන් කිරීමට කටයුතු කරනු ලැබේ. |

**1.6.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම නිරීක්ෂණය විය.

| නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 237 | දෙපාර්තමේන්තුව විසින් අරනෙරි පාසල් ළමුන් හා ගුරුවරුන් සඳහා නිල ඇඳුම් රෙදි මිල දී ගැනීමේ දී සහ හින්දු ජනතාව සඳහා ආගමික පොත් හා අරනෙරි පාසැල් ළමුන් සඳහා උපකාරක පොත් මුද්‍රණය කිරීමේදී අදාළ භාණ්ඩ ලැබී ඇති බවට තහවුරුකර ගැනීමෙන් තොරව රු.3,304,750 ක් ගෙවීම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ගෙවීම් සඳහා ලේඛන සකස් කර ඇතත් එම ගෙවීම අදාල පුද්ගලයින්ට නිකුත් කර නොමැත. |
| (ආ) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1.7. ඡේදය | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදුකර එම වාර්තා පසුව එළඹෙන වර්ෂයේ මාර්තු 31 දිනට පෙර ඉදිරිපත් කළ යුතු වුවත්,2017, 2018 හා 2019 වර්ෂවලට අදාලව පුස්තකාල පොත් සඳහා භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2020 අගෝස්තු 20 වන විටත් ලබා දී නොතිබුණි. | සියලුම භාණ්ඩ සඳහා වාර්ෂික සමීක්ෂණය සිදුකළ යුතු වීම. | භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් අදියරෙහි පවතී. |
| (ඇ) 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | වර්ෂ 5ක් එකම සේවා ස්ථානයෙහි සේවා කර ඇති සෑම නිලධාරියෙකුටම වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩදීම සඳහා ස්ථාන මාරු ලබා දිය යුතු වුවත්, වර්ෂ 5 සිට වර්ෂ 31 ක් දක්වා කාල පරාසයක් තුළ එකම ස්ථානයක සේවය කරනු ලබන නිලධාරීන් 85 ක් සඳහා එවැනි ස්ථාන මාරුවීම් ලබා දී නොතිබුණි. | චක්‍රලේඛයප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | නිලධාරින් සඳහා ස්ථාන මාරුවීම සම්බන්ධයෙන් අදාල පරිපාටිය අනුව වාර්ෂිකව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පුනරාවර්තන වැය විෂයයන් 6 ක් හා ප්‍රාග්ධන වැය විෂයයන් 4 ක් සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදනයෙන් සියයට 14 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ඉතිරිවීම්වල එකතුව රු.8,794,576 ක් විය. | මුදල් රෙගුලාසි 50 හි සඳහන් විධිවිධාන ඉටුවන පරිදි වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | නාස්තිය අවම වීම, අවශ්‍යතා ඇති නොවීම, 2019 අප්‍රේල් මාසයේදී රටෙහි ඇති වූ තත්ත්වය හේතුවෙන් පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකි වීම හා ඇතැම් අරනෙරි ගුරුවරුන් දිරිදීමනා ලබාගැනීම සඳහා බැංකු ගිණුම් විස්තර ඉදිරිපත් නොකිරීම ආදි කරුණු හේතුවෙන් ඉතිරිවීම් සිදුවිය. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ (2) (ඇ) ඡේදය ප්‍රකාරව යම් මුදල් වර්ෂයකට අදාල සියලුම බැරකම් එම වර්ෂය තුළ දී මුදල් ගෙවා නිදහස් කළ යුතු වුවත් ඊට පටහැනිව දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් 2 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් ඉතිරිය වූ රු.86,935 ක් ඉක්මවා රු.405,823 ක බැරකම්වලට එළඹ තිබුණි. | ඉතිරිවීම් ඉක්මවා බැරකම්වලට නොඑළඹිය යුතු වීම. | අදහස් දක්වා නොමැත |

| | | |
|---|---|---|
| (ආ) 2019 දෙසැම්බර් 3 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.4 ඡේදය ප්‍රකාරව වැය විෂයයන් හතරකට අදාලව මූල්‍ය ප්‍රකාශනවල සඳහන් රු.833,256 ක් භාණ්ඩාගාර ලේඛනවල හෙළිදරව්කර නොතිබුණි. තවද, වැය විෂයයන් තුනකට අදාලව 2020 වර්ෂයේදී නිරවුල් කරන ලද රු386,395 ක් මූල්‍ය ප්‍රකාශනවල හෝ භාණ්ඩාගාර ලේඛනවල ද හෙළිදරව් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල සඳහන් බැරකම් හා බැදීම් භාණ්ඩාගාර ලේඛන සමඟ එකඟ විය යුතු බැවින් සැසඳීමක් සිදුකළ යුතු වීම. | වැරදීමකින් රු.386,395 ක මුදල බැරකම් ලෙස සඳහන් කර නොමැත. නමුත් සියලුම වියදම් පසුගිය වසර ප්‍රතිපාදන සීමාවලින් වියදම් කර ඇත. |

## 2.3 අත්තිකාරම් ගිණුම් ශේෂ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ස්ථාන මාරු වී ගිය නිළධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.46,462 ක් වූ ණය ශේෂ වර්ෂ 28 කට අධික කාලයක සිට පැවත එන අතර එම ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. | ණය මුදල් අයකර ගැනීමේ දී ගැටළු සහගත තත්ත්වයක් පැන නැගී ඇති බැවින් එම ණය ශේෂ කපාහැරීම සඳහා වන ඉල්ලීම මහාභාණ්ඩාගාරය වෙත යොමුකර ඇත. |
| (ආ) සේවය හැර ගිය සේවකයන් 03දෙනෙකුගෙන් අය විය යුතු වර්ෂ 19 ත් 25 ත් අතරකාලයක සිට පැවත එන රු.40,469 ක් වූ ණය මුදල් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | -එම- | -එම- |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයප්‍රකාරව මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් 2017 හා 2018 වර්ෂවලට අදාළ කාර්යසාධන වාර්තාව 2020 අගෝස්තු 20 දින වනවිටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | 2017 හා 2018 වසර සඳහා වූ කාර්යසාධන වාර්තාව දැනට සකස් කර ඇත. එම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කඩිනමින් කටයුතු කරන බව දන්වා සිටිමි. |

### 3.2 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2008 වර්ෂයේ සිදුකළ භාණ්ඩ සමීක්ෂණය මඟින් හඳුනාගෙන තිබූ වටිනාකම නිශ්චය කිරීමට නොහැකි වූ නැති වූ පුස්තකාල පොත් 350ක් සම්බන්ධව මුදල් රෙගුලාසි 101 හා 102 පරිදි පරීක්ෂණ සිදුකර පාඩුව හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් ලේඛනගත කර නඩත්තු කිරීම් හා ඉවත් කිරීමේ කටයුතු මුදල් රෙගුලාසි ප්‍රකාරව කළ යුතු වීම. | පොත් රජයේ මුදල් උපයෝගී කරගෙන මුද්‍රණය කර නොමැත. ඒ අනුව මීට අදාළව මුදල් රෙගුලාසි 101 හා 102 පරිදි පරීක්ෂණ සිදු කර නොමැත. ඊට අදාළ උපදෙස් ලබා ගෙන කටයුතු කරනු ලැබේ. |